# ඔබේ දරුවාට ඔබේ බස උගන්වන්න

"සංක්‍රමණිකයන් වූ දෙමව්පියන් ගේ දරුවන් වූ අපට සිංහල ඉගෙනීමෙන් තිබෙන ප්‍රයෝජනය කුමක් ද?" යැයි මා උගන්වන ප්‍රජා පාසලක සිසුවෙක් ඉංග්‍රීසි බසින් මගෙන් ඇසුවේය. එය ඔහුගේම හෝ ඔහුගේ දෙමව්පියන්ගේ ප්‍රශ්නයක් විය හැක.

මෙම රටේ ඉගෙන ගන්නා දරුවන් ගෙන් වැඩි දෙනෙකුගේ පළමු බස ඉංග්‍රීසියයි. ඔවුන් සිංහල බස ඉගෙන ගන්නේ නම්, එය ඔවුන් ගේ දෙවන බස වේ. දෙවන බසක් ඉගෙන ගැනීමෙන් මොළයේ ක්‍රියාකාරීත්වය දියුණු කරන බවත්, ඔවුන්ගේ නිර්මාණශීලීත්වය වැඩි කරන බවත්, ගණිතය වැනි වෙනත් විෂයන් ඉගෙනීම පහසු කරන බවත්, සොයා ගෙන ඇත. එමෙන්ම, දෙවැනි බසක් ඉගෙන ගැනීම තවත් භාෂා ඉගෙනීම පහසු කරන බව ද, සොයා ගෙන ඇත.
භාෂාවක් ඉගෙනීම යනු එම බසින් කථනය, ලිවීම, කියවීම, ඇහුම් කන් දීම යන භාෂා කුසලතා ඇති කර ගැනීම හා වැඩි දියුණු කර ගැනීමයි. යම් භාෂාවකට වැඩියෙන් නිරාවරණය වීම එම බස ඉගෙනීම පහසු කරයි. අප නිවසේදී සිංහල බසින් කතා කරන්නේ නම් අපේ දරුවන් ඉතා පහසුවෙන් සිංහල බසට නිරාවරණය වීම සිදුවේ. එම නිසා, දෙමව්පියන්ගේ නිවැරදි මාර්ගෝපදේශකත්වය හා සැප වීම තිබේ නම්, අපේ දරුවන්ට සිංහල භාෂාව ඉගෙනීම වෙනත් භාෂාවක් ඉගෙනීමට වඩා පහසු වනු ඇත. එම නිසා ඔවුන්ට VCE විභාගය සඳහා සිංහල භාෂාව විෂයක් ලෙස ගෙන ප්‍රසාද ලකුණු ගැනීම එතරම් අපහසු කාර්යයක් නොවනු ඇත.

සිංහල ජාතියක් වශයෙන් අප ඉතා උසස් සංස්කෘතියකට උරුම කම් කියන බව අපි ඉතා උජාරුවෙන් කියමු. අතීත ශ්‍රී ලංකාවේ නගරයක් මැදින් වටිනා මැණිකක් අතින් ගෙන සර්වාභරණයෙන් සැරසුණු රූමත් ලලනාවකට නිරුපද්‍රිතව ගමන් කළ හැකිව තිබූ බව අපි අසා ඇත්තෙමු. එවන් හැදියාවක් අප ජාතිය සතුව තිබීම ගැන අපි ආඩම්බර වෙමු. ශ්‍රී ලංකාවෙන් බැහැරව, අප මෙරටේ ජීවත් වුව ද, අපේ දූ පුතුන් එවැනි හැදියාවකට අනුව හැදී වැඩීම අපි අපේක්ෂා කරමු. හැදියාවත්, සංස්කෘතියත් භාෂාව සමග එක්ව යන සාධක දෙකකි. සිංහල නොදන්නා ඔබේ දරුවා ඉංග්‍රීසි බසම හසුරුවමින් හැටවර වියට පත් වුවහොත්, ඔවුන් ඔබ අපේක්ෂා කරන අන්දමට ජීවත්වේයැයි ඔබ හිතන්නෙහිද?

ඔබේ දරුවාට ක්‍රමානුකූල සිංහල භාෂා අධ්‍යාපනයක් ලබා දිය හැකි, වික්ටෝරියානු ප්‍රාන්ත රජයෙන් පාලනය වන වික්ටෝරියානු භාෂා පාසලේ මධ්‍යස්ථාන කීපයක් වික්ටෝරියානු ප්‍රාන්තයේ විසිර ඇත. මෙම මධ්‍යස්ථාන වලින් වික්ටෝරියානු විෂය මාලාවට (Victorian Curriculum) අනුව සිංහල භාෂාව උගන්වනු ලැබේ. මෙම මධ්‍යස්ථාන වල අධ්‍යාපනය ලබා දෙන්නේ පලපුරුදු ගුරුවර ගුරුවරියන් මගිනි. වික්ටෝරියානු භාෂා පාසල මගින් සිසු දරු දැරියනට VCE විභාගයට පෙනී සිටීමට අවශ්‍ය භාෂා කුසලතා ලබා දෙනු ලැබේ.

ඉහත කී මධ්‍යස්ථාන අතුරින් නොබල් පාක්, බුවුන්ස් පාරේ කාවතා මධ්‍යස්ථානයේ (කාවතා විද්‍යාල් පරිශ්‍රයේ) සිංහල භාෂා අංශය ප්‍රධාන තැනක් ගනී. එය වසර 25කට අධික කාලයක් අපේ දූ දරුවනට සිංහල අධ්‍යාපනය ලබා දුන් මධ්‍යස්ථානයකි. එමෙන්ම, VCE විභාගයේ ඉතා හොඳ ප්‍රතිඵල ලබා ගත් මධ්‍යස්ථානයකි. දැනට එහි සෑම සෙනසුරාදා දිනකම පෙ.ව. 9.00 සිට ප.ව.12.20 දක්වා ළදරු පංතියේ සිට 12 වසර දක්වා පංති පැවැත්වේ. මෙයට අමතරව, සෙනසුරාදා දින වල භාෂා පාසලට පැමිණිය නොහැකි සිසුන්ට, ග්ලෙන් වේවර්ලි මධ්‍යස්ථානයේ (ග්ලෙන් වේවර්ලි ද්විතීයික විද්‍යාල් පරිශ්‍රය) අඟහරුවාදා දිනවල ප.ව. 4.00 සිට ප.ව. 6.30 දක්වා සිංහල භාෂාව ඉගෙනීමේ අවස්ථාව තිබේ.

මෙම මධ්‍යස්ථාන දෙකෙහිම, සිසුන්ට කථනය, ලිවීම, කියවීම, ඇහුම් කන් දීම යන භාෂා කුසලතා ඉතා හොඳින් ලබා දීමට අමතරව, ඔවුන් වෙනුවෙන් අළුත් අවුරුදු උත්සව, වාර්ෂික විවිධ ප්‍රසංග සංවිධානය කරනු ලැබේ. අළුත් අවුරුදු උත්සව වල දී සිසු සිසුවියන්ට ජන ගී ගායනා කිරීමටත්, ජන නැටුම් හා ශ්‍රී ලාංකික නර්තන ඉදිරිපත් කිරීමටත්, අළුත් අවුරුදු ක්‍රීඩා වලට සහභාගී වීමටත්, අවුරුදු කෑම වල රස බැලීමටත් අවස්ථාව ලැබේ. වාර්ෂික විවිධ ප්‍රසංග සංවිධානය කරනු ලබන්නේ සිසු සිසුවියන් ගේ නර්තන, රංගන, ගායනා, සංවාදනා, කථික ආදී විවිධ කුසලතා හඳුනා ගැනීමටත්, වැඩි දියුණු කර ගැනීමටත් ඉඩ ප්‍රස්ථා ලබා දීමේ අභිප්‍රායෙනි. සමහර අවස්ථාවලදී, සිසු සිසුවියන් ඔවුන් විසින්ම නිර්මාණය කරන ලද නර්තන හෝ රංගන නම සභාවට ප්‍රථම පුහුණු කර ඉදිරිපත් කරන්නේ අප්‍රමාණ සතුටිනි.

ඔබේ දූ දරුවන්ට ඔබගේත්, අපගේත් භාෂාව ඉගැන්වීමටත්, ඔවුන්ට අපගේ සංස්කෘතිය හඳුන්වා දීමටත් ඇති මෙම අගනි අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට ඔබට ආරාධනා කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

වැඩි විස්තර සඳහා ක්ෂේත්‍ර කළමණාකරු වන කෙවින් රයන් මහතා (කාර්යාල දුරකතන අංකය 98024326) හෝ සෙනසුරාදා දිනවල කාවතා කාර්යාලය (94740500) හෝ රෝහිණී ජයකොඩි ගුරු මහත්මිය (0430631249) අමතන්න. නැතහොත් 2020 නව පාසල් වාරයේ අඟහරුවාදා දින වල හෝ සෙනසුරාදා දින වල අදාල මධ්‍යස්ථානයට පැමිණෙන්න.





රෝහිණී ජයකොඩි
සිංහල භාෂා සම්බන්ධීකාරක
වික්ටෝරියානු භාෂා පාසල, කාවාතා මධ්‍යස්ථානය

